චක්‍ර ලේඛ අංක - 11/2016


මගේ අංකය / My No. } RG/MBD/10/විවිධ/මරණ/35

ඔබේ අංකය / Your No. }

දුරකථන අංක / Telephone Nos. } 2889488 / 2889489

ෆැක්ස් අංකය / Fax No. } 2889491

ඊ මේල් / E-mail } info@rgd.gov.lk / rg@rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

பதிவாளர் நாயகத் திணைக்களம்

REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය

தலைமை அலுவலகம்

HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site - www.rgdept.lk


දිනය / திகதி / Date: 2016/11/21

සියළුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්/ප්‍රාදේශිය ලේකම්වරුන්,

## අතුරුදහන් වූ තැනැත්තන්ගේ මරණ ලියාපදිංචි කිරීම/ දක්නට නොමැති බවට වූ සහතික නිකුත් කිරීම

මගේ අංක එම13/01/2005 හා 2011/02/01 දිනැති අංක 02/2011 දරන චක්‍රලේඛයට අමතර වශයෙනි. 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධි විධාන) පනත මගින්, අතුරුදහන් වූවන්ගේ මරණ ලියාපදිංචි කිරීමට ප්‍රතිපාදන සලසා ඇත. නමුත් සමහර පුද්ගල අතුරුදහන්වීම මරණයක් වශයෙන් සනාථ කිරීමට තරම් සාක්ෂි නොමැති වීම නිසා හෝ එම පුද්ගලයන් වෙනුවෙන් මරණ සහතිකයක් ලියාපදිංචි කරගැනීමට ඥාතීන් අකමැති වීම හේතුවෙන්, එම අතුරුදහන්වූවන් සම්බන්ධයෙන් ලියාපදිංචි කරන ලද කිසිදු නීතිමය ලියවිල්ලක් නොමැති වීමෙන් ඔවුන්ගේ ඥාතීන්ට විවිධාකාර ගැටළුවලට මුහුණ දීමට සිදුවේ.

02. එබැවින්, උතුරු හා නැගෙනහිර පළාත්වල සිදුවූ ගැටුම් හෝ එම ගැටුම්වලට පසුව හෝ දේශපාලන නොසන්සුන්තාව හෝ සිවිල් කැරලි කෝලාහල හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන්වී ඇති බවට වාර්තා කර ඇති තැනැත්තන් හෝ ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ ලෙස හඳුනාගෙන ඇති සන්නද්ධ හමුදාවල හෝ පොලිසියේ සාමාජිකයන් යන අයගේ අතුරුදහන් වීම ලියාපදිංචි කිරීමට හැකිවනසේ 2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ(තාවකාලික විධි විධාන) (සංශෝධන) පනතින් ප්‍රතිපාදන සලසා ඇත. එම නව පනතේ පිටපතක් මේ සමග එවමි.

03. ඒ අනුව අතුරුදහන් පුද්ගලයකු සඳහා, මරණ සහතිකයක් ලියාපදිංචි කිරීම පිණිස ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන්, 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධි විධාන) පනත හා අංක 02/2011 දරන චක්‍රලේඛ උපදෙස් අදාල කර ගන්න. අතුරුදහන් පුද්ගලයකු සඳහා, දක්නට නොමැති බවට වූ සහතිකයක් ලියාපදිංචි කිරීම පිණිස ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන්, 2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ(තාවකාලික විධි විධාන) (සංශෝධන) පනත ප්‍රකාර පහත උපදෙස් අදාල කර ගන්න.

### ඉල්ලුම්පත් භාර ගැනීම

I. ඉල්ලුම්කරු (8අ. (1) වගන්තිය)

"දක්නට නොමැති බවට වූ සහතිකයක්" ඉල්ලුම් කල යුත්තේ, අතුරුදහන්වී ඇති අයගේ ඥාතියෙකු විසිනි.

සැ.යු. - පනතේ 14 වගන්තියේ අර්ථ නිරූපනය අනුව "ඥාතියා " යනු,

i) කලත්‍රයා;
ii) දරුකමට හදාගත් ළමයින්, විවාහ නොවූ දෙමාපියන්ගේ ළමයින් හෝ සුළු දරුවන් ඇතුළත්ව දරුවන්;
iii) දෙමවුපියන්, සුළු මව, සුළු පියා, දරුකමට හදාගැනීමට ලබා ගත් තැනැත්තා;
iv) පූර්ණ හෝ අර්ධ සහෝදරයන් හෝ සහෝදරියන් හෝ දරුකමට හදාගත් සහෝදරයන් හෝ සහෝදරියන්;
v) මාමණ්ඩිය, නැන්දණිය, මස්සිනාවරුන්, නෑනාවරුන්, බෑණාවරුන්, ලේලිවරුන්;
vi) මුණුපුරු, මිණිපිරියන් සහ සීයලා සහ ආච්චිලා.

**ඉල්ලුම්පත් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම** (පනතේ 8 ඉ (1) වගන්තිය)

(අ) ඉල්ලුම්පතේ පිටපත් ප්‍රදර්ශනය කල දින සිට එක් මාසයක් ගතවූ පසු පමණක් පරීක්ෂණය පවත්වන්න.

(ආ) ඉල්ලුම්පතේ සඳහන් කරුණු සනාථ කිරීමට අවශ්‍යයයි ඔබ අදහස් කරන පුද්ගලයින් පමණක් පරීක්ෂණයට කැඳවන්න.අයදුම්කරු, ග්‍රාම නිලධාරී සහ අතුරුදහන් පුද්ගලයාගේ විස්තර දන්නා තවත් එක් පුද්ගලයෙකුගේ පමණක් සාක්ෂි සටහන් කර ගැනීම ප්‍රමාණවත් වේ.

(ඇ) විරෝධතා ඉදිරිපත් වී ඇත්නම්, විරෝධතා ඉදිරිපත් කළ අය සහ ඔහුගේ/ඇයගේ සාක්ෂිකරුවන් සිටින්නේ නම් ඔවුන්ද පරීක්ෂණයට කැඳවන්න.

(ඈ) පරීක්ෂණ දිනයේදී ප්‍රථමයෙන් ඉල්ලුම්කරුගේද, අනතුරුව ග්‍රාම නිලධාරී සහ ඉල්ලුම්පත සනාථ කරන අනෙක් සාක්ෂිකරුවන්ගේද ප්‍රකාශ සටහන් කර ගන්න.

(ඉ) පනතේ 8  උ(1) වගන්තිය යටතේ කටයුතු කිරීමේදී, නොමියන් සභාවල තීරණයේ සහතික කල පිටපතක් ද ඉල්ලුම්පත සමග ඉදිරිපත් කරන බැවින් එවැනි අවස්ථාවලදී තව දුරටත් පරීක්ෂණ පැවැත්වීම අනවශ්‍ය ය.

**නිර්දේශ කිරීම** (පනතේ 8 ඉ (3) වගන්තිය)

(අ) මෙම අතුරුදහන්වීම ලියාපදිංචි කරන්නේ/ලියාපදිංචි නොකරන්නේ ඔබගේ වාර්තාව සහ නිර්දේශය (ඇමුණුම 01 අ) මත වේ.

(ආ) දක්නට නොමැති බවට වූ සහතිකය ලියාපදිංචි කිරීමේදී අවශ්‍ය වන, නමුත් ඉල්ලුම් පතේ සඳහන් නොවන අවසන් වරට දුටු ස්ථානය, රැකියාව හෝ තත්ත්වය යන කරුණු පරීක්ෂණයේදී ලබා ගන්න.

(ඇ) අතුරුදහන් පුද්ගලයා "ජීවත්ව සිටී නම් වයස" ඉල්ලුම් කරන දිනට අනුව සටහන් කරන්න.

(ඈ) අයදුම්කරුගේ ඥාතිත්වය පනතේ 14 වගන්තිය ප්‍රකාර පැහැදිළිව ඔබගේ වාර්තාවේ සඳහන් කරන්න.

(ඉ) අතුරුදහන් පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත් අංකය පරීක්ෂණයේදී නිසැකවම අනාවරණය කර ගත්තේනම් පමණක් ඔබේ වාර්තාවේ සඳහන් කරන්න.

(ඊ) අයදුම්පත සම්බන්ධයෙන් ඔබට සෑහීමකට පත් විය නොහැකි නම්, ඒ බව ඔබගේ නිර්දේශයේ පැහැදිළිව සඳහන් කරන්න.

(උ) ඔබ වෙත ඉදිරිපත් වූ ඉල්ලුම්පත්වලට අදාලව පරීක්ෂණ පවත්වා එම අතුරුදහන්වීම ලියාපදිංචි කිරීමට/ලියාපදිංචි නොකිරීමට ඔබගේ නිර්දේශය ඇමුණුම 01 අ මගින් ඉදිරිපත් කරන්න.

**අනුමැතිය සඳහා අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත එවීම**

(අ) ඔබගේ නිර්දේශය සඳහන් කල අයදුම්පත් සහ වාර්තා යොමු කල යුත්තේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි කලාපය භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතය.

(ආ) සෑම අයදුම්පතක්ම ඇමුණුම අංක 06 ආකෘතිය මගින් යොමු කරන්න.

(ඇ) විරෝධතා ඉදිරිපත්ව තිබිණි නම්, එම ලිපියේ (ඇමුණුම 06) පිටපතක් විරෝධතා ඉදිරිපත් කළ අයටද යවන්න.

**අභියාචනා** (පනතේ 8 ඊ වගන්තිය)

රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් කරන ලද තීරණයකට අතෘප්තියට පත් අයදුම්කරුවෙකුට හෝ 8ඈ වගන්තිය යටතේ විරෝධතාවයක් ඉදිරිපත් කළ එය නිශ්ප්‍රභ වූ තැනැත්තෙකුට එම ප්‍රතික්ෂේප කිරීම හෝ, සහතිකය නිකුත් කිරීම පිළිබඳව වූ දැන්වීමේ දින සිට මාසයක් ඇතුළතදී දිසා අධිකරණයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකිය. ඒ අනුව ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කල ඉල්ලුම්පත්වලට අදාල ඉල්ලුම්කරුවන් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන්න.

**දක්නට නොමැති බවට වූ සහතිකය ලියාපදිංචි කිරීම**

(අ) ඔබ විසින් යොමු කළ වාර්තාවලට අදාලව සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අනුමැතිය ඇමුණුම 01ආ මගින් ලැබුණු පසු දක්නට නොමැති බවට වූ සහතිකය ලියාපදිංචි කිරීමට පියවර ගත යුතු වේ.

(ආ) දක්නට නොමැති බවට වූ සහතික ලියාපදිංචි කිරීමේ, පිටපත් 03න් සමන්විත, ලියාපදිංචි කිරීම ආ 2 අ ආකෘතියෙන් යුත් ලේඛනයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යා යුතුය.

(ඇ) තවද දක්නට නොමැති බවට වූ සහතික ලියාපදිංචි කිරීම පිළිබඳ විස්තර ඇතුළත් (ඇමුණුම 07) ලේඛනයක්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යා යුතුය. ( පනතේ 8ඌ (2), (3) වගන්ති)

04. මෙම පනත යටතේ ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රමුඛතාවයක් දී ක්‍රියාකරන මෙන් කාරුණිකව දන්ව අවශ්‍ය වන මුද්‍රිත ආකෘති මේ සමග එවා ඇති ආදර්ශ ඇමුණුම්වලින් පිටපත් කර ගැනීමට කටයුතු කරන්න. ලියාපදිං කරන ලද සහතිකය, එය අයදුම් කරන ලද "ඥාතියා"ට පමණක් නිකුත් කිරිමට පියවර ගන්න.

05. මෙම කාරණය සම්බන්ධයෙන් ඔබගේ කොට්ඨාසයේ සේවය කරන සියළුම ග්‍රාම නිලධාරීවරුන් දැනුවත් කර, මෙයට අදාලව උනන්දුවක් දක්වන මහජනයාටද මේ පිළිබඳව අවබෝධයක් ලබා දෙන මෙන් ග්‍රාම නිලධාරීන්ට; උපදෙස් දෙන්න.

06. මෙම චක්‍ර ලේඛ උපදෙස් ලද බව කරුණාකර මා වෙත වාර්තා කරන මෙන්ද, මෙම පනත යටතේ දක්නට නොමැති බවට වූ සහතික ලියාපදිංචි කිරීම පිළිබඳව මාසික ප්‍රගති වාර්ථාවක් (ඇමුණුම 07 මගින්ම) මා වෙත එවීමට; පියවර ගන්නා ලෙසද වැඩි දුරටත් කාරුණිකව දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඊ. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:

1. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කරු, දැ.ගැ.ස.
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.
3. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්, මධ්‍යම ලේඛනාගාරය - අවශ්‍ය කටයුතු සඳහා
4. කලාප භාර සියළුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - අවශ්‍ය කටයුතු සඳහා
5. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්/ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.ස.

ඇමුණුම 01

ආ ආකෘතිය (8අ (2) වගන්තිය)

<u>අතුරුදහන් වූ තැනැත්තෙකු ලියාපදිංචි කිරීම සඳහා සහ දක්නට</u>

<u>නොමැති බවට වූ සහතිකයක් නිකුත් කිරීම සඳහා වූ ඉල්ලීම.</u>

1. අතුරුදහන් වූ තැනැත්තාගේ සම්පූර්ණ නම:
2. ස්ත්‍රී/පුරුෂභාවය සහ ජාතිය:
3. උපන් දිනය:
4. අවසන් වරට දුටු දිනය (ආසන්න වශයෙන්):
5. අවසන් වරට පදිංචි ව සිටි නිවසේ ලිපිනය:
6. ස්ථිර පදිංචි ලිපිනය:
7. ඥාතියා ලෙස ඉල්ලුම් කරන තැනැත්තාගේ සම්පූර්ණ නම සහ ලිපිනය:
8. අතුරුදහන් වූ තැනැත්තාට ඥාතියා ලෙස ඉල්ලුම් කරන තැනැත්තාගේ ඇති නෑකම:
9. අතුරුදහන් වූ තැනැත්තාගේ :

    පියාගේ සම්පූර්ණ නම:

    මවගේ සම්පූර්ණ නම:

    කලත්‍රයාගේ සම්පූර්ණ නම:

    යැපෙන්නන්ගේ සම්පූර්ණ නම්:

ඉහත කී ............................................................ (අතුරුදහන් වූ තැනැත්තාගේ නම) යන අය අවුරුද්දකට වැඩි කාලයක් දක්නට නොමැති බව ........................................ ...... පදිංචි .................................... ................ වන මම මෙයින් ප්‍රකාශ කරමි.

එම නිසා එකී තැනැත්තා ............................................................ (අතුරුදහන් වූ තැනැත්තාගේ නම) 2010 අංක 19 දරන මරණ සහ අතුරුදහන් වී ඇති තැනැත්තන් ලි[illegible] කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තෙකු ලෙස ලියාපදිංචි කරන ලෙස [illegible] තැනැත්තා සම්බන්ධයෙන් දක්නට නොමැති බවට වූ සහතිකයක් ඥාතියා වශයෙන් මා වෙත නිකුත් කරන [illegible] ඉල්ලා සිටිමි.

අතුරුදහන් වූ බවට වාර්තා කර ඇති තැනැත්තා ජීවත්ව සිටින බවට සොයා ගනු ලැබුවහොත් හෝ මරණය[illegible] ඇති බවට සාක්ෂි ලැබුණහොත් මා විසින් ඒ බව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත නොපමාව දැනුම් දෙමි.

දිනය ...............

.....................

ඉල්ලුම්කරුගේ අත්සන

ඇමුණුම 01අ

<u>දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වාර්තාව</u>

පසුපිට ඉල්ලුම්පත්‍ර යේ සඳහන් කරුණු සත්‍ය බවට මම සෑහීමකට පත් වෙමි/ සෑහීමකට පත් නොවෙමි. එබැවින්, මෙම අතුරුදහන් වීම 2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ(තාවකාලික විධි විධාන) (සංශෝධිත) පනත යටතේ, මෙහි පහත සඳහන් විස්තර ඇතුළත් කර දක්නට නොමැති බවට වූ සහතිකයක්;

**ලියාපදිංචි කිරීම සුදුසු බවට/ලියාපදිංචි කිරීම නුසුදුසු බවට මම නිර්දේශ කරමි.**

1. ලියාපදිංචි කල යුතු දිස්ත්‍රික්කය : ...... ........... කොට්ඨාසය .. ...........
2. දක්නට නොමැති තැනැත්තාගේ සම්පූර්ණ නම: ..................................
3. දක්නට නොමැති තැනැත්තාගේ ජාතික හැඳුනුම්පත් අංකය: ..........................
4. අවසන් වරට දුටු දිනය සහ ස්ථානය: ......................................
5. ස්ත්‍රී/පුරුෂ භාවය: .............................
6. ජාතිය: ..................
7. ජීවත්ව සිටී නම් වයස: ...................
8. රැකියාව හෝ තත්ත්වය: ..................
9. දක්නට නොමැති තැනැත්තාගේ :
   පියාගේ සම්පූර්ණ නම: ................................
   මවගේ සම්පූර්ණ නම: ................................
   කලත්‍රයාගේ සම්පූර්ණ නම: ..............................
   යැපෙන්නන්ගේ සම්පූර්ණ නම්: ............................
10. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය: ..........................

..........................
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ ප්‍රාදේශීය ලේකම්

...................... දිස්ත්‍රික්කය

දිනය : 20...........................

ස්ථානය : ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

......................

(නිල මුද්‍රාව)

---

ඇමුණුම 01ආ

<u>රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අනුමැතිය</u>

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,

...........................

ඔබගේ නිර්දේශය අනුව ඉහත විස්තර ඇතුළත් කර, දක්නට නොමැති බවට වූ සහතිකයක් ලියාපදිංචි කිරීම ස... අනුමත කරමි/අනුමත නොකරමි.

..................
සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,

........................ ........ කලාප කාර්යාලය,

(නිල මුද්‍රාව)

ඇමුණුම 02

# දිවුරුම් ප්‍රකාශය

........................ දිස්ත්‍රික්කයේ ..........................................................
(ප්‍රකාශකගේ ලිපිනය)

............ පදිංචි .................................................................. වන මම

........................ වශයෙන් මෙහි පහත සඳහන් කරුණු සත්‍ය බවට අවංකවද,* ගාම්භීරතා පූර්වකව ද
මෙයින් දිවුරා ප්‍රකාශ කරමි./දිව්රා ප්‍රතිඥා දෙමි.

1. මෙහි ප්‍රකාශක මම වෙමි.
2. .............................. පදිංචිව සිටි ..................................
(අතුරුදහන් අයගේ පදිංචිය) (අතුරුදහන් අයගේ සම්පූර්ණ නම)

යන අය මාගේ .................................. ය.

(අතුරුදහන් පුද්ගලයාට ප්‍රකාශකගේ ඥාති සම්බන්ධය)

3. ඔහු/ඇය ........................... දිනට පසු දක්නට නොමැති අතර, දැනට එක් අවුරුද්දකට
(අවසන් වරට දුටු දිනය)

වැඩි කාලයක් ඔහු/ඇය ජීවතුන් අතර සිටින බවට කිසිම ආරංචියක් නැත.

4. එම නිසා ඔහු/ඇය ..........................................................................
.................................... හේතුවෙන් අතුරුදහන් වී ඇති බව මම විශ්වාස කරමි.
(අතුරුදහන් වීමට හේතුව)

5. ඉහත සඳහන් කරුණු මාගේ දැනීමේ සහ විශ්වාසයේ හැටියට සත්‍ය බව මෙයින් සහතික කරමි.

ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක විසින්
මෙම දිවුරුම් ප්‍රකාශය කියවා බලා නිවැරදි
බව වටහාගෙන වර්ෂ 20.......................
වන දින............................................. දී
මා ඉදිරිපිටදී *දිවුරා/ප්‍රකාශ කර අත්සන් කරන ලදී.

| |
|---|
| නිසි මුද්දරය |

දිවුරුම් ප්‍රකාශකගේ අත්සන

සමාදාන විනිශ්වයකාර තැන
(නිල මුද්‍රාව)

*අනවශ්‍ය වචන කපා හරින්න

...............................

ග්‍රාම නිලධාරී,

..............................

20.......................... දින

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්,

...........................

**<u>2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ(තාවකාලික විධි විධාන) (සංශෝධන) පනත</u>**

**<u>දක්නට නොමැති බවට වූ සහතිකයක් ලියාපදිංචි කිරීම</u>**

දැනට අතුරුදහන් වී ඇති, .........................................

.............. යන අය මාගේ කොට්ඨාසයේ ......................................

.................... යන ලිපිනයේ අවසන් වරට පදිංචිව සිටි බවත්, ඔහු/ඇය දැනට එක් අවුරුද්දකට වැඩි කාලයක් තුළ ජීවතුන් අතර සිටින බව ඇසින් නොදුටු බවත් ආරංචියක් හෝ අසන්නට නොවූ බවත් මම මෙයින් ප්‍රකාශ කර ස්ථිර කරමි.

...............................

ග්‍රාම නිලධාරී

අංක .......... කොට්ඨාසය

(නිල මුද්‍රාව)

යොමු අංකය:

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

...................

20..................දිය

ග්‍රාම නිලධාරී,

...................

<u>අතුරුදහන් වූ තැනැත්තෙකු ලියාපදිංචි කිරීම</u>

2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත යටතේ ............ ................................. ගේ අතුරුදහන් වීම ලියාපදිංචි කිරීම සඳහා ................ ................................... පදිංචි .................................... ....... විසින් මා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් මේ සමග එවමි.

02. කරුණාකර එය ඔබේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ සති දෙකක කාලයක් ප්‍රදර්ශනය කරන්න. ඉන්පසු, ඒ බව මෙහි පහත සඳහන් ආකෘතියෙන් මා වෙත වාර්තා කරන්න.

......................

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ප්‍රාදේශීය ලේකම්

---

ඇමුණුම 04 ආ

යොමු අංකය:

.........................

20..................දින

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ප්‍රාදේශීය ලේකම්

.........................

<u>අතුරුදහන් වූ තැනැත්තෙකු ලියාපදිංචි කිරීම</u>

ඔබේ අංක .......................... සහ .......................... දින දරන ලිපිය සමග එවන ලද 2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධි විධාන) (සංශෝධන) පනත යටතේ ....... ............................................. ගේ අතුරුදහන් වීම ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත 20.................දින සිට 20 ................ දින දක්වා මාගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශණය කල බව මෙයින් වාර්තා කරමි.

................

ග්‍රාම නිලධාරී

කොට්ඨාසය ................

| |
|---|
| |

(නිල මුද්‍රාව)

# <u>දැන්වීමයි</u>

## <u>2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ(තාවකාලික විධි විධාන) (සංශෝධන) පනත</u>

ඉහත සඳහන් පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තෙකු ලියාපදිංචි කිරීම සඳහා මා වෙත ලැබී ඇති ඉල්ලුම්පතක පිටපතක් මෙයට අමුණා ඇත.

02. මෙම අතුරුදහන් වීම ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් හෝ ඥාතියා පත් කිරීම සම්බන්ධයෙන හෝ යම් විරෝධතාවයක් ඇත්නම්, එම විරෝධතාවය මෙම දැන්වීම ප්‍රදර්ශනය කල දින සිට එක මසක් ඇතුළතදී ලිඛිතව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වමි.

03. විරෝධතා ඉදිරිපත් කිරීමේදී එම විරෝධතාවලට හේතු පැහැදිළිව සඳහන් කල යුතු අතර විරෝධතා ඉදිරිපත් කරන්නා විසින් සහ වෙනත් යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් මගින් එකී විරෝධතාවය තහවුරු කල යුතු ය.

04. තවද වැඩිමනක් වශයෙන් විරෝධතා තහවුරු කිරීම සඳහා වෙනත් සාක්ෂි ද ඉදිරිපත් කල යුතු ය.

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ප්‍රාදේශීය ලේකම්

දිනය ...................

................... ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

---

ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ඇලවීම සඳහා

ඇමුණුම 06

මගේ අංකය:

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,

..................

..................

..................දින

[illegible] රෙජිස්ට්‍රාර් ජනරාල්,

................................ කලාප කාර්යාලය,

..................

<u>අතුරුදහන් වූ තැනැත්තෙකු ලියාපදිංචි කිරීම</u>

2015 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ(තාවකාලික විධි විධාන) (සංශෝධන) පනත යටතේ .......................................... ගේ අතුරුදහන් වීම ලියාපදිංචි කිරීම සඳහා ........................ පදිංචි .......................................... මහතා/මහත්මිය විසින් මා වෙත ඉදිරිපත් කරනලද ඉල්ලුම්පත සහ එම ඉල්ලුම්පතට අදාලව මාගේ වාර්තාව මේ සමග එවමි.

*

02. එම අතුරුදහන් වීමට අදාලව දක්නට නොමැති බවට වූ සහතිකයක් ලියාපදිංචි කිරීමට මා විසින් නිර්දේශ කර ඇති අතර, දක්නට නොමැති බවට වූ සහතිකය ලියාපදිංචි කිරීමේදී ඇතුළත් කල යුතු විස්තර මාගේ සහතිකයේ සඳහන් කර ඇත.

*

03. එම අතුරුදහන් වීමට අදාලව දක්නට නොමැති බවට වූ සහතිකයක් ලියාපදිංචි නොකිරීමට මා විසින් නිර්දේශ කර ඇති අතර, ඒ අනුව මේ සම්බන්ධයෙන් දිසා අධිකරණයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකි වේ.

..............................

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ප්‍රාදේශීය ලේකම්

පිටපත: ඉල්ලුම්කරු - දැ.ගැ.ස.

*අනවශ්‍ය වචන කපා හරින්න